**සිංහල පරිවර්තනය**

**උ.ප.රා.සේ.කො.ස චක්‍රලේඛ අංක : 01/2021**

මගේ අංකය : **NP/07/10/01/150**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය.
08.01.2021

ලේකම් - කාන්තා කටයුතු අමාත්‍යාංශය,
සමූපකාර සංවර්ධන කොමසාරිස්,
සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්,
උතුරු පළාත.

**උතුරු පළාත් රාජ්‍ය සේවයේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන සහකාරකොමසාරිස්, III වන ශ්‍රේණියේ තනතුරට ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතා පදනම මත බඳවා ගැනීම - 2021 –**

උතුරු පළාත් රාජ්‍ය සේවයේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, III වන ශ්‍රේණියේ තනතුරට ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතා පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති උතුරු පළාත් දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන නිලධාරි සේවයට අයත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වනුයේ 2021.01.22 වන දිනයයි.

**02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි-**

2.1. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටි නියමයන්ට අනුව සේවා කොන්දේසීන් අදාල වේ .

2.2 මෙම නිවේදනය ප්‍රකාර අයදුම්කරන අයදුම්කරුවන්ට උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කිරීමට නියමිත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැවැත්වෙන ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු ප්‍රමාණයේ ප්‍රමුඛතාවය පදනම් කරගෙන බඳවා ගනු ලැබේ.

2.3 මෙම පත්වීමට පත්කරනු ලබන අයදුම්කරුවන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේව කිරීම සඳහා බැඳී සිටිය යුතුයි.

2.4 ඉහත සඳහන් තනතුරට දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන නිලධාරීන් අයදුම් කරන විට තම තමන්ගේ අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුයි. එමෙන්ම ඉහත සඳහන් තනතුරට අයදුම්කරු තෝරා පත් කර ගන්නා විට එම නිලධාරියා අදාළ තනතුර සඳහා නිදහස් කළ හැකි බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුයි. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහත පරිදි නිර්දේශ නොකරන අයදුම්පත් භාරගනු නොලැබේ.

**03. වැටුප් පරිමාණය :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 පරිදි. (**SL** 1 - 2016) යන වැටුප් කේතයේ රුපියල්. **47,615 – 10 x 1,335 – 8 x 1,630 – 17 x 2,170 – රුපියල්. 110,895/-** ක් වේ. 2016.02.25 වැනි දින දරණ අංක 03/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උප ලේඛනයේ II හි සඳහන් පරිදි වැටුප් දීමනා ගෙවනු ලැබේ. (3වන වැටුප් පියවරට එළඹීමට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් වී තිබිය යුතුයි)

**04. බඳවා ගැනීම සඳහා වූ මූලික සුදුසුකම් :-**

**4.1 වයස් සීමාව :-**

ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කරගෙන බඳවා ගන්නා විට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

4.2 **සුදුසුකම්** :

(අ). දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන නිලධාරි තනතුරේ අවම වශයෙන් අයදුම්පත් භාරගන්නා දිනට (22.01.2021) ප්‍රථම පූර්වාසන්න වසර **තුනක්** (03) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර වැටුපු වර්ධකයන් **තුනක්** (03) සපයා තිබිය යුතුයි.

(ආ). අනුමත ක්‍රියාකාරකම් සඳහා වූ හැකියා පුරෝකථන සැලසුමට අනුව අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (22.01.2021) ප්‍රථමයෙන් වූ පූර්වාසන්න වසර **තුනක** (03) කාලය තුළ සතුටුදායක හෝ එයට ඉහළ මට්ටමේ කාර්යසාධන හැකියාවන් ලබා තිබිය යුතුයි.

**05. සාමාන්‍ය සුදුසුකම්** :-

අයදුම්කරුවන් ඉහත සඳහන් තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීමට අවශ්‍ය ශාරීරික හා මානසික නිරෝගී භාවයෙන් හෙබි පුද්ගලයන් විය යුතුයි.

**06. බඳවා ගැනීමේ ක්‍රමය** :-

6.1. උතුරු පළාතේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් තනතුරට අනුමත බඳවා ගැනීමේ පරිපාටිය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, ආයතන සංග්‍රහය, පළාත් ප්‍රතිපත්තීන් හා නිවේදනයේ 10 වන ජේදයේ සඳහන් විධිවිධානයන්ට එකගව බඳවා ගනු ලැබේ ඒ සමගම අයදුම්කරුවන් ව්‍යුහමය සම්මුඛ පරික්ෂණයකට කැඳවනු ලබන අතර මෙම නිවේදන මගින් කැඳවා ඇති සුදුසුකම් සියල්ල පරික්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් සපුරා නැති බවට අනාවරණය වන අවස්ථාවක දී මෙම තනතුර සඳහා ඇති හිමිකම ද අවලංගු කරනු ලැබේ.

6.2. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් තනතුරට අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩුවී ඇති පුරප්පාඩුවලට කුසලතා පදනම මත අනුමත කරන ලද ව්‍යුහමය සම්මුඛ පරික්ෂණය මගින් තනතුරු උසස්වීම් ප්‍රදානය කරනු ලැබේ.

6.3. සියළුම අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසානය දිනයට (22.01.2021) ප්‍රථම තනතුරට අදාළ සියළුම සුදුසුකම් සපුරා තිබීම අත්‍යාවශ්‍යයි. අයදුම්පත් භාරගන්නා අවසානය දිනයට (22.01.2021) ප්‍රථමයෙන් සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සුදුසුකම් සපුරා නැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**07. අසත්‍ය තොරතුරු සඳහා වූ දඬුවම්** :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට සැලකිලිමත් ලෙස නිවැරදි තොරතුරු ලබා දීමට කටයුතු කළ යුතුයි. මෙම ව්‍යුහාත්මක සම්මුඛ පරික්ෂණ නියමයන් පරිදි කවර අයදුම්කරුවෙකු හෝ ව්‍යුහාත්මක සම්මුඛ පරික්ෂණයට ප්‍රථමයෙන් හෝ, ව්‍යුහාත්මක සම්මුඛ පරික්ෂණය පැවැත්වෙන අවස්ථාවේ දී හෝ ව්‍යුහාත්මක සම්මුඛ පරික්ෂණයෙන් පසුව හෝ නැතිනම් කුමණ අවස්ථාවකදී හෝ සුදුසුකම් සපුරා නැති බවට අනාවරණය වුවහොත් ඒ සඳහා වූ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අයදුම්කරුවකු ඉදිරිපත් කර ඇති තොරතුරු අසත්‍ය තොරතුරු බව අනාවරණය වන කුමණ මොහොතක හෝ නිලධාරියා පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු යෙදෙනු ඇත. ඉහත ජේදය **6.3 හි** සඳහන් කරුණු කෙරෙහි අයදුම්කරුගේ අවධානය යොමු විය යුතුයි.

**08. අයදුම්කරන ක්‍රමය** :-

8.1. මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 (21cmx29cm) ප්‍රමාණයෙන් යුත් කඩදාසියක දෙපැත්ත පමණක් භාවිතා කර, අංක 01 සිට 11 දක්වා පළමු පිටුවේ ද අංක. 12 සිට 15 දක්වා දෙවන පිටුවේද අන්තර්ගත වන පරිදි අයදුම්පත සකසා ගත යුතුයි.

8.2. අදාළ ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන, නිවැරදි ආකාරයට සම්පූර්ණ නොකළ හා අයදුම්පත් කිසිදු පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ වශයෙන් අයදුම්පත සම්පූර්ණ නොකිරීමෙන් ඇති වන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුයි. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් තම භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. මෙම දැන්වීම මගින් දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව අයදුම්පත් සකසා ඇති බවට අයදුම්කරුව විසින් වගවිය යුතුයි. එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3. අයදුම්පත් යොමු කරනු ලබන කවරයේ වම් උඩ කෙළවරේ **"සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, III වන ශ්‍රේණියේ තනතුරට ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතා පදනම මත බඳවා ගැනීම – 2021"** යනුවෙන් සඳහන් කර එවිය යුතුයි.

8.4. ක්‍රමානුකූලව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021 **ජනවාරි මස** 22 වන දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් **"ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට යොමු කළ යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසානය දිනයට පසුව ලැබෙන අදුම්පත් භාරගනු නොලැබේ.

**09.** අයදුම්කරුගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(iii) වලංගු රියදුරු බලපත්‍රය

**10. ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය :-**

ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

\- **(සම්පූර්ණ ලකුණු ප්‍රමාණය 100)**

| අංක | **ලකුණු ප්‍රදානය කරන විෂය පථයන්** | **උපරිම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| **01. ජ්‍යෙෂ්ඨතාවය** | | |
| 01.1 | සමූපකාර සංවර්ධන නිලධාරී සේවයේ දිස්ත්‍රික් නිලධාරියෙකු සේ සේවය කළ සේවා කාලයට වසරකට ලකුණු $7^1/_2$ බැගින් උපරිමය වසර 10කට හා එයින් කොටසකට | **ලකුණු** 75 |
| **02. කාර්යසාධනය** | | |
| 02.1 | වැඩබලන දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන නිලධාරියකු වශයෙන් / වැඩබලන සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන් සේවය කළ එක් එක් වසර සඳහා ලකුණු 01 බැගින්. | **ලකුණු** 05 |
| 02.2 | දුෂ්කර ප්‍රදේශ සේවා කාලය තුළ ලබාගත් ප්‍රසංශා සඳහා ලකුණු 01 බැගින් උපරිම ලකුණු 05 යි | **ලකුණු** 05 |
| 02.3 | විනය කටයුතු බලධාරියකු / වංචා හෝ බලය අයුතු ලෙස භාවිතා කිරීම සම්බන්ධ පරීක්ෂණ බලධාරියා ලෙස කටයුතු කර තිබීම | **ලකුණු** 05 |
| **03. සුවිශේෂී සුදුසුකම්** | | |
| 03.1 | උපාධියට සමාන විෂයක උසස් අධ්‍යාපන සුදුසුකම් | **ලකුණු** 05 |
| 03.2 | අදාළ විෂයේ ඩිප්ලෝමා සහතිකයට ලකුණු 01 බැගින් උපරිම සහතික 03ක් | **ලකුණු** 03 |
| 03.3 | මව බස දෙමළ / සිංහල හැර වෙනත් භාෂාවන් වලින් ලබා ගත් කුසලතාවයට ලකුණු 01 බැගින් (අකුරු හා කථන) | **ලකුණු** 02 |
| | **සම්පූර්ණ ලකුණු ප්‍රමාණය** | **ලකුණු** 100 |

**11.** මෙම නිවේදනය මගින් සඳහන් කර ඇති හෝ සඳහන් කර නැති කරුණු වලින් අදහස් වන හෝ අදහස් නොවන කිසියම් පැහැදිලිවීමක් නැති කරුණු සම්බන්ධයෙන් වූ වෙනස් කිරීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් ගන්නා තීරණය අවසන් තීරණය වනු ඇත. එමෙන්ම කිසියම් විශේෂ කාරණාවන් නිසා අදාළ ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට නොහැකි තත්ත්වයක් උද්ගත වන විට එය සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් ගන්නා තීරණය අවසන් තීරණය වනු ඇත.

**12.** සේවා අවශ්‍යතාවය පදනම් කරගෙන මෙම තනතුර සඳහා වූ පුරප්පාඩු සම්පූර්ණ කරන විට එම පුරප්පාඩු වල කොටසක් හෝ සම්පූර්ණයෙන් පිරවීම සම්බන්ධ තීරණය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි.

**එස්. තිරුවාකරන්,**

ලේකම්,

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

උතුරු පළාත්.

08.01.2021